# 4. අසිරිමත් කිතු උපත

කිතුනු අපට ලොව සුවිශේෂී උපත වන්නේ ජේසුස් වහන්සේගේ උපත යි. උන්වහන්සේ මෙලොවට වැඩියේ අයහපතින් අපව මුදවා දෙවියන් වහන්සේට අයිති දරුවන් බවට පත් කරවන්නට යි. දෙවියන් වහන්සේ අපට ඇති ආදරය නිසා තම එක ම පුත් ජේසුස් වහන්සේ මෙලොවට එවූ සේක. ජේසුස් වහන්සේගේ උපතට සම්බන්ධ පුද්ගලයන් හා සිදුවීම් පිළිබඳ ව අධ්‍යයනයෙන් කිතු උපතේ සුවිශේෂී භාවය වටහා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත යි.

**කියවා බලමු.**
**ශු. ලූක් 1: 26-31**
**ශු. ලූක් 2: 1-20**



## ගාබ්‍රියෙල් දේව දූතයා



4.1 රූපය - ගාබ්‍රියෙල් දේව දූතයා

ගාබ්‍රියෙල් දේව දූතයා දෙවියන් වහන්සේට සේවය කරන, සුබ ආරංචි ගෙනෙන දූතයා සේ හඳුන්වනු ලැබේ. ජේසුස් වහන්සේගේ උපත සඳහා මරියතුමිය ව තෝරා ගත් බව එතුමියට දැනුම් දුන්නේ ගාබ්‍රියෙල් දේව දූතයා ය. ළදරුවාගේ නම ජේසුස් විය යුතු බව ද එතුමාණෝ මිදුම්කරුවාණෝ බව ද දේව දූතයා විසින් ප්‍රකාශ කරන ලදි. (ශු. මතෙව් 1:21) දේව දූතයකු මෙම උපත දැනුම් දීම තුළින් ම උපතේ සුවිශේෂී බව ප්‍රකාශ වෙයි. ජේසුස් වහන්සේගේ උත්පත්තිය සම්බන්ධ ව එඬේරුන්ට දැනුම් දීම කරනු ලැබූයේ දේව දූත සමූහයක් මගිනි. මෙයින් ද අපට පෙනෙන්නේ ජේසුස් වහන්සේගේ උපතේ ඇති සුවිශේෂී භාවය යි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# මරියතුමිය හා ජෝසෙප්තුමා



4.2 රූපය - මරියතුමිය හා ජෝසෙප්තුමා

ගාබ්‍රියෙල් දේව දූතයා දැනුම් දුන් ලෙස ජේසුස් වහන්සේගේ උපත සඳහා තමන් ව තෝරා ගත් බව ඇසූ කළ මරියතුමිය බිය වූවා ය. කැළඹුණා ය. නමුත් එතුමිය දේව කැමැත්තට එකඟ වෙමින් නිහතමානී ව යටත් වූවා ය.

ජෝසෙප්තුමා මෙම සුවිශේෂි දරු උපත සඳහා දේව අණට කීකරු වෙමින් මරියතුමිය රැකබලා ගත් බව පැහැදිලි ය.

# එඬේරුන්



4.3 රූපය - එඬේරුන්

ජේසුස් වහන්සේගේ උපත දේව දූතයන් මුලින් ම දැනුම් දෙනු ලැබුවේ එඬේරුන්ට ය. එය විශේෂ කරුණක් වන්නේ ප්‍රථමයෙන් එම උපත පිළිබඳ ශුභාරංචිය එකළ සමාජයේ පිළිගැනීමට ලක් නොකළ දුප්පත් එඬේරුන්ට දැනුම් දුන් බැවිනි. පණිවුඩය ලද විගස ම ඔවුහු ඊට ප්‍රතිචාර දක්වමින් බෙත්ලෙහෙමට පැමිණ බිළිඳු ජේසුස් වහන්සේ බැහැදැක නමස්කාර කළ හ. මෙම සුවිශේෂී බිළිඳා ඔවුහු දුටු හ. ඉන් අපට මෙම උපතේ සුවිශේෂී භාවය වඩා දැකිය හැකි ය.

# ශාස්ත්‍රවන්තයින්ට මග පෙන්වූ විශේෂ තාරකාව



4.4 රූපය - ශාස්ත්‍රවන්තයින්ට මග පෙන්වූ විශේෂ තාරකාව

ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂී බව ශ්‍රාස්ත්‍රවන්තයින් විසින් වටහා ගනු ලැබුවේ අහසේ පැවූ තාරකාව මගිනි.

මෙම තාරකාව ඔවුන්ට බෙත්ලෙහෙම කරා ගමන් කිරීමට මග පෙන්වා තිබේ. මොවුහු **රත්තරන්, තුවරලා හා ගන්ධරස** පුදා ජේසු බිළිඳාණන්ට නමස්කාර කළහ. ශාස්ත්‍රවන්තයන්ගේ නමස්කාරයත් මග පෙන්වූ තාරකාවත් ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂී භාවය සඳහා තවත් සාක්ෂ්‍ය වේ.

# ගව ඔරුව

ජේසුස් වහන්සේ නිසි ලෙස හඳුනා ගැනීමට දේව දූතයින් දුන් ලකුණ වූයේ **"රෙදි වලින් ඔතා ගවයින් කන ඔරුවක බාවා ඇති බිළිඳකු"** යන්න යි.

මෙය ඉතා වැදගත් වන්නේ දේව පුත්‍රයා දිළිඳු දරුවකු ලෙස ඉපදීමත් බෙත්ලෙහෙම් නගරයේ නවාතැන් පලක් නොලැබී, ගව මඩුවක උපත ලබන්නට සිදු වීමත් ය.



4.5 රූපය - ගව ඔරුව

ජේසුස් වහන්සේගේ උත්පත්තිය පිළිබඳ සිද්ධීන් අතර දේව දූතයන් ගැයූ ගීතිකාව උතුම් අර්ථයක් ප්‍රකාශ කරයි.

*"අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහිපිට ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා!"*

මෙලෙස ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂී බව වටහා ගනිමින් අප ද අපගේ ප්‍රතිචාරය දැක්විය යුතු ය. දේව දූතයින් ගැයූ ලෙසට උන්වහන්සේගේ උපත මුළු ලෝකයටම සාමය ගෙන දෙන උපතක් ලෙසට හඳුන්වා දිය හැකි ය. දෙවියන් වහන්සේ හා මිනිසා අතරත් මිනිසා හා මිනිසා අතරත් අසමගිය දුරු කරන්නටත් බිඳුණු සබඳතා ගොඩ නගන්නටත් ජේසුස් වහන්සේගේ උපතින් හැකි විය. එතුමා සාමයේ කුමාරයා සේ හඳුන්වනු ලබයි. සාමය නොමැති හදවත්වලට සාමයත් කොන් කරනු ලැබූ, පීඩාවට ලක් කරනු ලැබූ අයගේ ජීවිතවලට බලාපොරොත්තුවත් ජේසුස් වහන්සේ ගෙන ආ සේක. එදා එතුමන් උපත ලැබූ ජන සමාජයට සාමය ලැබුණේ යම් සේ ද අද සමාජයට ද ජේසුස් වහන්සේගේ උපත තුළින් සාමයේ පණිවුඩය ගෙන එනු ලබයි.

**කටපාඩම් කරමු.**
**ශු. ලූක් 2: 11-12**

**ක්‍රියාකාරකම:**

1. ශුද්ධවූ බයිබලයේ සඳහන් පරිදි බිලිඳු ජේසු බැහැදැකීමට පැමිණි අය නම් කරන්න.

2. නත්තල සැමරීම හා සම්බන්ධ ව කිතුනුවන් යොමු වන යහපත් පිළිවෙත් 3ක් පෙන්වා දෙන්න.